**SINH 4102**
**ජන කලා අධ්‍යයනය**
**අත් පත්‍රිකා අංක 01**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ**

## ජන කලාව හැඳින්වීම

- ජන කලාව යනු පොදු ජනයා අතර පවත්නා, එසේ ම උගතුන් විසින් නො ව සාමාන්‍ය ගැමි ජනතාව විසින් ම නිර්මාණය කරනු ලබන, යම් ආස්වාදන ගුණයක් ඇති නිමැයුම් වේ.
- ජනශ්‍රැති විශාරද මෂාරුල් ඉස්ලාම් ජනශ්‍රැති ක්ෂේත්‍රය කොටස් හතරකට වර්ග කර ඇත. ජන කලා ඉන් එක් කොටසකි.
  1. ජන සාහිත්‍යය - ජන කතා, ජනකවි, ජන ගී, ගැටපද, තේරවිලි, ප්‍රහේලිකා, උපමා, ආදර්ශ පාඨ, ජන වහර, යන්ත්‍ර මන්ත්‍ර, යැදීම, උපදේශ, අවවාද ආදී වූ ආධ්‍යාපනික දැනුම, කුරුටු ගී, බිත්ති පාඨ, විහිළුතහළු, ලිංගික දෑ, උත්තර ප්‍රති උත්තර, ආචාර සමාචාර යනාදිය
  2. ජන පිළිවෙත් - දෛනික ව සිදු කරන පිළිවෙත් හා ඉඳහිට හෝ වරින්වර සිදු කරන පිළිවෙත් ආදිය
  3. ජන කලා - රඟ දැක්වෙන කලා, නැටුම් ගැයුම් හා ක්‍රියාකාරී කලා, චිත්‍ර, මූර්ති, කැටයම්, රෙදි පිළි, ආභරණ ආදිය
  4. ජන විද්‍යා හා තාක්ෂණ - වෛද්‍ය විද්‍යා, සූප ශාස්ත්‍ර, ඉංජිනේරු විද්‍යා, වන විද්‍යා, තාක්ෂණ වාස්තු විද්‍යා, යකඩ කර්මාන්ත, ධීවර කර්මාන්ත, ප්‍රවාහන මහා මාර්ග ආදිය
- ජන කලාව වනාහි කලාවේ එක් ප්‍රබේදයකි. එය සමාජ සංස්කෘතික හර පද්ධතීන් පරාවර්තනය කරන ආරම්භය පිළිබඳ නිශ්චිත ව නො දන්නා කලාවකි. මේ සඳහා වන තවත් නිර්වචනයක් වන්නේ එය සාමාන්‍ය ජනතාව විසින් පරපුරෙන් පරපුරට රැගෙන ආ හර පද්ධතීන් හා සංස්කෘතිකමය දායාදයන් ප්‍රකාශිත කිසියම් නිර්මාණයක් හෝ ඉදිකිරීමක් වන බව යි. ඉතිහාසඥයන් මානව විද්‍යාඥයන් ජනකලාව හඳාරන්නේ එය අතීත සංස්කෘතිය කෙබඳුදැයි හඳුනාගැනීමට විවෘත කරන ලද කලාත්මක කවුළුවක් වන හෙයිනි.

- ජන කලාව ලෝකයේ සාම්ප්‍රදායික සංස්කෘතිය විදහා දක්වන ප්‍රකාශනයකි. ජනතාවගේ සහ සංස්කෘතියේ අනන්‍යතාව පිළිබිඹු කරන, ප්‍රජාවගේ ගුණාංග හා සෞන්දර්යය පරපුරෙන් පරපුරට රැගෙන යන සංස්කෘතියෙහි මුල් බැස ගත් කලාවකි.

- ජන කලාව නිපදවා ඇත්තේ යම් සුවිශේෂී සහ හඳුනාගත හැකි ලක්ෂණ සහිත ප්‍රදේශයක හෝ ප්‍රජාවක් විසිනි. එමෙන් ම එය එම ප්‍රදේශයට හෝ ප්‍රජාවට ආවේණික සංස්කෘතිය හා භෞතිකමය ද්‍රව්‍ය මත රඳා පවතී. ජන කලාව සහ සම්බන්ධව පවතින්නේ කුඹල් කර්මාන්තය, වඩු කර්මාන්තය, රෙදි පිළි කර්මාන්තය වැනි සමාජයේ ජීවත් වෙන මිනිසුන්ගේ අවශ්‍යතා හා චෛන්ද්‍රිය ලෙස බැඳුණු නිෂ්පාදන සමඟිනි. එමෙන් ම ප්‍රායෝගික ව ක්‍රියාකාරී ව භාවිත වන කලා ශිල්පාත්මක දෑ සමඟ ද ජනකලාව සම්බන්ධිත ය. එසේ ම ජන කලාව ස්වයං ඉගෙනුම් කලාවක් සහ පිටස්තර කලාවක් ලෙස ද විමර්ශනය කෙරේ. චිත්‍ර කලාව, මූර්ති කලාව, කුඹල් කර්මාන්තය සහ එබඳු අඥාත කර්මාන්තයන් ද මේ යටතට ගැනේ.

- ජන කලා යනු මූර්ත ද්‍රව්‍යයන්ගෙන් හෝ සම්ප්‍රදායානුකූල ශිල්ප ධර්මයන් යොදා ගෙන සැකසුණු, එසේත් නැතිනම් සමාජයේ තනි ව හෝ කණ්ඩායමක් වශයෙන් ජනසම්මත කලාවක් ව පැවත පසු ව මුඛ පරම්පරාගත සම්ප්‍රදායකින් පැවතෙන දෙයක් හෝ මානවවංශික සංස්කෘතිකමය ගතියක් ප්‍රකාශ කිරීමක් ලෙස හැඳින්විය හැකි ය.

**SINH** 4102
**ජන කලා අධ්‍යයනය**
**අත් පත්‍රිකා අංක 02**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ**

---

- කුඩා ජන කොටස් අතර පවතින සෞන්දර්යාත්මක සන්නිවේදනය තුන් ආකාරයකකින් සිදුවන බව ජනශ්‍රැති විද්‍යාඥයකු වන ඇස්. ජී. සමරසිංහ පවසා ඇත.

- ඒ මෙසේ යඃ- පළමුවැන්න නම් ජනශ්‍රැති ආඛ්‍යාන සහ විද්‍යා සම්ප්‍රදාය ප්‍රගුණ කරවන වාචික හෝ ලිඛිතමය භාෂාමය සන්නිවේදනය යි. දෙ වැන්න මිනිසුන්ගේ දෛනික ක්‍රියා, සිරිත්විරිත්, ඇදහිලි ක්‍රම, ඉවුම්පිහුම් ආදිය යි. තෙ වැනි කොටසට අයත් වන්නේ සංගීතය, චිත්‍ර, මූර්ති ආදිය යි.

- ජන කලා නිර්වචනය කිරීමේ දී පළමු කොට ම අවධාරණය කරනු ලබන්නේ එහි 'ජන' ගුණයට යි. ***ජන*** යනු කිසියම් ජන කොට්ඨාසයක් හෝ ජන සමූහයක් ලෙසින් අර්ථ දැක්විය හැකියි. ලෝ වැසියා ප්‍රජාව යන අර්ථය ද එයින් විද්‍යමාන ය.
 Folk - people in general. Whether male or Female. ජනයා ලෙස ඇතැම් විට නම් කරනුයේ තනි පුද්ගලයෙකි. එය ස්ත්‍රී වාචක හෝ පුරුෂ වාචක විය හැකි ය. ජන සමූහයක් එක් වූ තැන ඇතිවන්නේ ජන සමාජයකි (Folk Society). කලාව බිහි වන්නේ මේ ජන සමාජය තුළිනි.

- අනෙක් ගුණය 'කලාව' යන්න යි. ***කලාව*** යන්න විශාල ක්‍ෂෙත්‍රයක් ආවරණය කරනු ලබන විෂයක්‍ෂෙත්‍රයකි. ඒ පිළිබඳ ව විවිධ නිර්වචන රාශියක් මෙන් ම කෘති රාශියක් ද ලියැවී තිබේ. පරිකල්පනයෙන් ආස්වාදනය කළ හැකි හෝ වින්දනයක් බවට පත් කළ හැකි යම් නිර්මාණයක් වේ ද එය කලාව බව සාමාන්‍ය පිළි ගැනීම යි. වාත්ස්‍යායන වැනි පෙරදිග විද්වතුන් ද ඇරිස්ටොටල්, ප්ලේටෝ, ටෝල්ස්ටෝයි වැනි අපරදිග විද්වතුන් ද කලාව පිළිබඳ සරල මෙන් ම සංකීර්ණ නිර්වචන ඉදිරිපත් කොට තිබේ.

- ජන කලාවේ අනෙක් කැපී පෙනෙන ගුණය වන්නේ 'ශ්‍රැති' යන්න යි. (මෙය ජන කලාව, ජනශ්‍රැති ක්ෂේත්‍රයට අයත් වීම හේතුවෙන් දැකිය හැකි ලක්ෂණයකි.) ***ශ්‍රැති*** යන්නෙන් ධ්වනිතාර්ථවත් වන්නේ පරපුරෙන් පරපුරට අසා දැනගැනීමෙන් මේවා ගෙන එනු ලබන බව යි. එනම් මුඛ පරම්පරාගත ස්වරූපය යි.

- 'අඥාත කර්තෘත්වය' ද මෙහිලා කැපී පෙනෙන තවත් ලක්ෂණයකි. ***අඥාත කර්තෘත්වය*** යනු නිශ්චිත කර්තෘවරයකු නොමැති බව යි. ජන කලාවේ දී වැදගත් ස්ථානයක් හිමි වී ඇත්තේ කර්තෘට වඩා කලාවට බව මෙයින් පැහැදිලි වේ. එසේ ම අඥාත කර්තෘත්වය හේතුවෙන් එය සාමුහික ප්‍රයත්නයක් වන බවත් කාලයෙන් කාලයට එහි ආකෘතික සහ ස්වරූපමය වෙනස්කම් කිරීමේ හැකියාවත් ඇති බව දැකිය හැකි ය.

- 'දැනුම් සම්භාරය' ජන කලාවේ දැකිය හැකි තවත් වැදගත් ලක්ෂණයකි. ***දැනුම් සම්භාරය*** යනු ජන කලාවේ අන්තර්ගතය යි. එනම්, පැරණි සමාජය ප්‍රත්‍යක්ෂ ඥානයෙන් ලබා ගත් සියල්ල යි.

- 'පෞරාණික බව' ද ජන කලාව හා අත්‍යන්තයෙන් බැඳුණකි. ***පෞරාණික බව*** යන්නෙන් පැවසෙන්නේ ජන කලාව අතීතය හා බැඳී ඇති බව යි. ආනන්ද කුමාරස්වාමි පවසන්නේ මෙය ඉතිහාසගත යුගයට බොහෝ ඈත සිට පැවත එන දැනුම් සම්භාරයක් බව යි.